**පාඩම :- සාධක හා ගුණාකාර ( 1 වන සතිය)**

**කාලච්ඡේද ගණන :- 09**

- පෙළපොතේ 137,138 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. දී ඇති පුටු 6 පේළි හා තීර ලෙස පිළියෙල කර ඇති ආකාරය බලන්න.

ඒ අනුව 6 ලබා ගත හැකි ආකාර සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස පහත පරිදි ලැබෙන බව හඳුනාගන්න.

$6 = 1 \times 6$

$6 = 2 \times 3$

$6 = 3 \times 2$

$6 = 6 \times 1$

- 138 පිටුව බලන්න. එහි සඳහන් පරිදි පුටු 12 ඉහත ආකාරයට පිළියෙල කිරීමේදී පුටු 12 ලැබෙන ආකාරය සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස පහත පරිදි හඳුනාගන්න.

$12 = 1 \times 12$

$12 = 2 \times 6$

$12 = 3 \times 4$

$12 = 4 \times 3$

$12 = 6 \times 2$

$12 = 12 \times 1$

- මෙලෙස පහත දැක්වෙන සංඛ්‍යා , සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස ලිවිය හැකි ආකාර ලියන්න.

1) 18 2) 24 3) 30 4) 40

| |
|---|
| කිසියම් පූර්ණ සංඛ්‍යාවක් , පූර්ණ සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස ලියූ විට ඒවා එක එකක් මුල් සංඛ්‍යාවේ සාධක වේ. |

16 හි සාධක ලිවීමේදී 16 ට අදාල පහත ගුණිතයන් පමණක් ප්‍රමාණවත් බව හඳුනාගන්න.

| <u>සියලු ගුණිත</u> | <u>ප්‍රමාණවත් ගුණිත</u> |
|---|---|
| $16 = 1 \times 16$ | $16 = 1 \times 16$ |
| $16 = 2 \times 8$ | $16 = 2 \times 8$ |
| $16 = 4 \times 4$ | $16 = 4 \times 4$ |
| $16 = 8 \times 2$ | |
| $16 = 16 \times 1$ | |

එම නිසා, 16 හි සාධක = 1, 2, 4, 8, 16

- 20 හි සාධක

$20 = 1 \times 20$
$20 = 2 \times 10$
$20 = 4 \times 5$

එම නිසා, 20 හි සාධක = 1, 2, 4, 5, 10, 20

**0, කිසිදු පූර්ණ සංඛ්‍යාවක සාධකයක් ලෙස නො ගැනේ.**

පෙළපොතේ 139 පිටුවේ 11.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු ගණිත ගුරුභවතා සමඟ සාකච්ඡා කරන්න.

- 140 පිටුව නිවැරදිව අධ්‍යයනය කරන්න. දී ඇති ගුණන වගුව හොඳින් අධ්‍යයනය කරන්න.
- සංඛ්‍යාවක් සාධක දෙකක ගුණිතයක් ලෙස ලියා එම සාධක හඳුනා ගන්න.

ගුණන වගුව භාවිතයෙන් පහත සංඛ්‍යාවල සාධක ලියන්න.

1) 14 2) 20 3) 30 4) 32

පෙළපොතේ 141 පිටුවේ 11.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු නිවැරදි කර ගැනීමට උත්සහ කරන්න.

**<u>බෙදීමේ ක්‍රමය මඟින් සාධක සෙවීම</u>**

146, 147 පිටු හොඳින් කියවන්න. සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් ඉතිරි නොමැතිව බෙදෙන අවස්ථා නිරීක්ෂණය කරන්න.

උදා:-

16 ÷ 8                                 15 ÷ 8

$$8\overline{)16} = 2,\quad 16 - 16 = 0$$

$$8\overline{)15} = 1,\quad 15 - 8 = 7$$

16 ÷ 8 = 2 ඉතිරි 0                    15 ÷ 8 = 1 ඉතිරි 7

යම් පූර්ණ සංඛ්‍යාවක්, පූර්ණ සංඛ්‍යාවකින් ඉතිරි නැතිව බෙදේ නම් එම සංඛ්‍යාව මුල් සංඛ්‍යාවේ සාධකයක් වේ.

- 16, 8න් ඉතිරි නැතිව බෙදේ. එමනිසා 8, 16 හි සාධකයක් වේ.
- 15, 8න් ඉතිරි නැතිව නො බෙදේ. එමනිසා 8, 15 හි සාධකයක් නො වේ.

143 පිටුව බලන්න. 11.3 අභ්‍යාසය සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු නිවැරදි කරගන්න.

143 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න. සංඛ්‍යාවක ගුණාකාර යනු කුමක්දැයි නිවැරදිව අවබෝධ කරගන්න.

සංඛ්‍යාවක් තවත් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීමෙන් එම සංඛ්‍යාවේ ගුණාකාර ලබාගත හැකිය.

උදා:-

3 × 1 = 3

3 × 2 = 6

3 × 3 = 9

3 × 4 = 12

මෙලෙස 3 හි ගුණාකාර 3, 6, 9, 12, 15, ... වේ.

- පහත දැක්වෙන සංඛ්‍යාවල මුල් ගුණාකාර 5 ලියන්න.

1) 5    2) 7    3) 10    4) 12    5) 15

පෙළපොතේ 144 පිටුවේ ක්‍රියාකාරකම 1 නිවැරදිව සම්පූර්ණ කරන්න.

පෙළපොතේ 145 පිටුවේ 11.4 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

- 146 පිටුව හොඳින් අධ්‍යයනය කර ගුණාකාර ආශ්‍රිත නිදසුන 1 ගැටළුව නිවැරදිව අධ්‍යයනය කරන්න.

  146 පිටුවේ නිදසුන 1 අනුව 147 පිටුවේ 11.5 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.